
අසලියා
නොමියෙන පෙමක
මල් සුවඳ...
එච්.පී.ජී.දිනිති මනීෂා ජයලත්

# අසලියා

එච්.පී.ජී.දිනිති මනීෂා ජයලත්

වෙනත් කෘති
ලෝක සවාරිය

පාසල - මහමයා බාලිකා විද්‍යාලය
පන්තිය - 9 E
පල කරන දිනය- 2026.05.10
**ISBN - 978-624-211-025-7**

# ...පිදුම...

අප ග්‍රන්ථකරණයට යොමු කරවූ


විදුහල්පතිතුමියටත්,උපදෙස් දුන්

ගුරු මෑණිවරුන්ටත්,පියවරුන්ටත්

,මාගේ දෙමව්පියන්ටත්, නන්

අයුරින් සහය වූ යෙහෙළියන්ටත්,

## තුති පුදමි !



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# පලමු පරිච්ඡේදය...

එදින සතියේ දිනයකි.කටු මැටි ගෙයෙහි වහලය මතට මලානික හිරැ එළියක් වැටී තිබුණි.මිදුලේ මල් ගස් මැලවී තිබුණි.ගෙපිල මත දිගා වූ බලු නගුටා කෙඳිරිගෑවේය.ගෙදර ඉදිරියේ පුටුවේ වාඩි වී සිටි සිරිසේන තම නිකට අතගාමින් මහා කල්පනාවක සිටියේය. ගෙදර තිබූ එකම පුටුව එය විය.දෑවැද්දට හමුවූ දෑ අතර වටිනාම දෙය එය විය. ගෙදර ඇතුල කාමරයෙන් ගැහැණියකගේ විලාපයක් ඇසේ. "කට වහගෙන හිටපන් කෙල්ලේ ඔබ ඇඬුවයි කියලා ඕක හරියනවායැ" යි සිරිසේන කෑ ගැසුවේය. කාමරයේ ලණු ඇඳ මත ගැහැණියක් කෙඳිරි ගෑවාය.

ඇගේ ඇඳ අසල වයස අවුරුදු දොළහක පමණ ක් දැරියක් හඬමින් සිටියාය වයසා අවුරුදු පහළොවක් පමණ කොට කලිසමක් හා බැනියම් කෑල්ලක් හැඳ සිටි කොලුවෙකු ඒ අසලම බලා සිටියේය. "අනේ අම්මා.... අමාරුයිද....දොස්තර මහත්තයෙක් ළඟට යමු කෝ" දැරිය හඬමින් කීවාය. ගැහැණිය කඳුළු පිරී දෙනෙතින් තමා දරුවන් දෙස බැලුවාය. ඔවුන් දැන් අසරණ වීමට යයි.

කොලුවාට තම නැගණිය පිළිබඳව මහ දුකක් දැනුණි. මුළු නිවසින්ම මේ ගැහැණිය පිළිබඳව දුකක් දැනුනේ කෙල්ලට පමණි. සිරිසේන තම හඬ අවදි කළේය ගෑනියේ උඹ කෙඳිරි කෑවයි කියලා මක් කරන්ටද මොකෝ අපිට ඉංගිරිසි බෙහෙත් ගන්න සල්ලි හාගේ තියෙනවා කියලායැ" කෙල්ලට මේ කතාව නොරිස්සුවාය. "ඔය කොත්තමල්ලි ටිකක් එහෙම බීලා නැගිටපන් රෑට කන්න මඤ්ඤොක්කා අල දෙක තුනක් ගලවන් එන්නම්" කියා සිරිසේන මක් පුටුවෙන් නැගිට්ටේය. කෙල්ල පියාගේ සිතිව ගොස් දැරිය දිව ගොස් පියාගේ දෙපා මුල ඇද වැටුණි. "අනේ අප්පච්චි අම්මාට දොස්තර කෙනෙක් ලඟට අන්න යමුකෝ" දැරිය කඳුළු වගුරුවමින් කියා සිටියාය. සිරිසේන දැරියව තල්ලු කළේය. " උඹ පලයන් අහකට උඹට ඕවා තේරෙන්නෑ" ඔහු මිදුල හරහා තරහෙන් පුපුරමින් ගොස් කඩුල්ල පැන්නේ ය. " මෙතන ඔලුව නැති කොල්ලෙක් ක්ට මගේ සයම යවනවා මදිවට මේ ගෑනි කෙල්ලයි එකතුවෙලා මගේ ඔලුව කනවා" මෙසේ මුමුණමින් සිරිසේන ගුරුපාට අවතීර්ණ විය

දැරිය තම කුරිරු පියා ණන් ගමන් කරන දෙස බලා සිටිමින් හැඬුවා ය. ඇය කුඩා කල සිටම මෙවැනි දේ වලට හුරුවී සිටියාය ඇය වඩාත් ආලය කරේ තම මවට ය. නමුත් මවද නැවත නොඑන ගමනක් යෑමට සැරසෙන සේයාවකි අප්පච්චි ඇයට කොහොමත් කැමති නැත. එයට හේතුව ඇය නොදනී. අයියා තමාට ආදරය කල දසොයා බැලුවද ඔහුට වෙන කිසිවෙකුත් පිළිබඳ ව හැඟීමක් දැනීමක් නැත. එයට හේතුව ඇය නොදැන සිටියද බොහෝ විට අම්මා හා අප්පච්චි කරන්න ඇතිවන්නේ අයියා පිළිබඳ කතා කිරීමෙන් බව ඇය දනී.නිවස වියවුල් වීම ඇයට දුකකි.

# දෙවන පරිච්ඡේදය...

සිරිසේන ගුරුකාරයේ ඇවිද ගියේ ය. ඔහුට නිවසින් පිටතට පැමිණීම මහත් සහනයක් විය දම් වෙළදෙසට හැරෙන තැන පැමිණියද මඤ්ඤොක්කා ගැලවීමට හිතක් නොතිබිණි එනිසා ඔහු කෙලින්ම ඉදිරියට ඇවිද යමින් සිතුවිලි සාගරයක ගිලුණි ඔහු කමලාවතී සමඟ විවාහ වූයේ මීට වසර දහසයකට පෙරය. ඔවුන්ගේ පළමු දරුවා අමරය. කොලුවෙකු ට ලැබීම ගැන සිරිසේන මහා සතුටු විය. නමුදු එය තිබුනේ වසරක පමණ කුඩා කලකි. කොලුවාට වයස අවුරුදු තුනේදීද ඔහු කිසිවක් කතා නොකළේය. "අම්මා අප්පච්චි" කියාඅසන්නට සිරිසේන හා කමලාගති සිහින මැව්වෝය. නමුදු එසේ කතා කිරීමට ඔහුට නොහැකිය . දරුවා " එන්.ඒ.එෆ්." රෝගයෙන් පීඩා විඳින්නෙකි. එනිසා ඔහුට හැඟීම් දැනීම් නැත. මෙනිසා සිරිසේනට නිවස අප්‍රිය විය. ඔහුට දරුවා අරහං විය. පියකු ලෙස ඕනෑම අයෙකුට ඇති ආඩම්බරය තම කොලුවාය. දැන් ඔහුට අවනම්බුවකි. පාරෙ යන ගමන් ඔහු මේ පිළිබඳ සිතුවේය. අමර ඉපදී වසර දෙකකට පමණ පසු එක් රැයකින් සිරි සේනට ජීවිතය තවත් අඳුරු දවසක් එළඹිණ.

එදින මහා වරුසාවකි. මහ රෑ හෙන ගසිමෙන් වැසි ඇදහැලුනි. කමලාවතී දරුවා නිදිකෙරෙව්වාය. සිරිසේන පුටුවේ දිගා වුවා පමණි. වැසි හඬ මැද දරුවකු හඬනු ඇසිණි. " ඔය කොලුවව නිදිකරපන් අඬනවා" " මම කොලු පැටියව නිදි කරලා හුඟක් වෙලා"කියමින් කමලාවතී කාමරයෙන් පිටතට ආවාය "නෑ නෑ මට ඇහෙනවා හොඳට අහගෙන ඉඳපන්" දෙදෙනාම මූණට මූණ බලා ගත්තෝය. දොර දෙසට සෙමෙන් ගොස් ඒ විවෘත කළහ. දොර මුල සිනිඳු රෝස පැහැති රෙද්දකින් එතු පොදියකි. සිනිදු දෑත් විහිදුණි. "ළමයෙක් !" කමලාවතේ කෑ ගසා කුඩා රෝස පොදිය තම දෑතට ගත්තාය. රෝස කම්මලකි. දිලිසෙන දෑසකි. "කෙල්ලෙක් අනේ හරි හුරුබුටියි" කමලාවතීගේ දෑසද දිලිසුණි.සිරිසේන වත්ත වටේ බැලුවේය. කට්ට කලුවර පමණි.වැස්ස නිසා සොයාගෙන යාමටද නොහැක.පරිසරය හීතල වුවද සිරිසේනගේ ඔලුව කම්මලකි.කමලාවති දරුවන්ට කොහොමත් කැමතිය. දැන් සිටින දරුවා මන්දබුද්ධික නිසා එක් අතකට මේ දරුවා වාසනාවකි.

දෙදෙනා ම දරුවා රැගෙන ගෙතුළට ගියෝය. සිරිසේන කල්පනාවට බර විය. උණුසුම් වූ සිඟිත්තිය හැඩීම නැවැත්වූවාය. "අනේ කෙල්ලව හදාගමු කොල්ලට ඉගෙන ගන්නවත් පුළුවන් කියලායැ මේ කෙල්ල හරි සිරියාවන්තයි" කමලාවති කීවේ මේ පොදිය තමා ළගට ගැනීමේ මහත් ආශාවෙනි.කල යුත්තක් සිතා ගත නොහැකි වූ සිරිසේන කමලාවතිගේ ආශාවට ඉඩ දී නිහඬ වූවේය. කමලාවති දරුවා රැගෙන කාමරයට ගියාය. අවුරුදු තුනක් පමණ වූ අමර ඇහැරී සිටියේය. "මේ බලන්න කවුද ආවේ කියලා උඹට නංගියෙක්" අමර නැගණිය දෙස බැලුවේය. කුඩා සුරතල් බිලිඳිය සිනාසුනාය.ටික වේලාවක් බලා සිටි අමර " නංගී" යැයි කීවේය. කමලාවති පුදුම වී බලා සිටියාය. "සිරි....ඉක්මනට මෙහේ එන්නකෝ මේ කෙල්ල අපිට වාසනාව ගෙනාවා"

සිරිසේන දුවගෙන ආවේය. " කොල්ලා කතාකරා....නංගී කියලා කිව්වා"කමලාවති සතුටු කඳුලු හෙලමින් සිගිත්තිය දෙස බලා සිටියාය. " කාලෙකට පිපෙන අසලියා මලක් වගේ මගේ කෙල්ල......."

සිරිසේනට එදින මතකය කිසිදාක අමතක නොවේ.කුඩා දැරිය පැමිණීම වාසනාවක් වුවද පසුව එය අවාසනාවකට පෙරලුණි.දැරිය පැමිණ මසකින් කමලාවතිට මැලේරියාව වැලදුණි.ගම්මුන්ගෙන් දැරිය ගැන ප්‍රශ්න ද කෙලවර නොවීය.මැලේරියාව සුව කිරීමට මුළු සේසතම යට කිරීමට සිදුවිය.වසර දොලහකට පසු නැවත එය පැමිණ ඇත.මෙවර බලාපොරොත්තු රහිතය.සිරිසේන මේ ගැන සිතමින් ඉදිරියට ඇවිද ගියේය.

# තෙවන පරිච්ඡේදය...

වැව් තාවුල්ලේ ඇවිද ගියේ කඩවසම් හැඩි දැඩි පිරිමියෙකි.කොලඹ සිට රජරටට පැමිණි මොහු ලාංකීය සුවදට ඇලුම් කලේය.ඔහු සමග රජරට මිනිසුන් හරි සුහදය.

" දොස්තර මහත්තයා...දොස්තර මහත්තයා" ඔහු හැරී බැලුවේය. කොට කලු මිනිසෙකි . කලින් දැක ඇත. " අනේ දොස්තර මහත්තය බොහොම පින්" හතිදැමූ මිනිසා කියාගෙන ගියේය. " අපේ පොඩි එකා දැන් හොදට ඉන්නවා පින් මහත්තයෝ" " හරි හරි ගුණපාල ඕක මගේ රාජකාරිය නේ" දොස්තර මහතා ගුණපාල සමග කතාවට වැටුනි. " මෙහේ මිනිස්සුන්ගේ ජීවිත හිතන තරම් සුන්දර නැහැ මහත්තයෝ ඔය පේන්නෑ සිරිසේන" " ආ..මට මතකයි අර හේන් කොටන කෙනානේ" "ඔව්...ඔව් ඒ ගෑනි මහ දුකක් විදින්නේ ඔය මන්දබුද්ධික කොල්ලා නිසා"වෛද්‍යවරයාට තමා ළගට පැමිණි අසරණ ගැහැණිය සහ ඇගේ මන්ද බුද්ධික දරුවා සිහිකරන්නට විය . " හ්ම්... ඒ දරුවාට තියෙන්නේ මහා භයානක තත්ත්වයක් සමහරවිට අවුරුදු විස්සක් විසිපහක් විතර වෙද්දි මැරෙන්නත් පුළුවන්" වෛද්‍යවරයා කීවේය. "මොනවා වුණාත් ඒ කොල්ලා තමන්ගෙ නංගිට තියෙන්නේ පුදුම ආදරයක් යන යන තැන පස්සෙන් ඒ උනාට වෙන මිනිස්සු ගැනවත් අඩුම තරමේ අම්මා අප්පා ගැනවත් කිසි හැඟීමක් නෑ" වෛද්‍යවරයා මේ අසරණ මිනිසුන්ගේ දුක් දොම්නස් අසා සිටියේය. " ඒ කෙල්ල නම් අයියට වැඩිය කැමති නෑ...... ගමේ කොල්ලො කුරුට්ටොන්ගේ වැඩේම ඔය දෙන්නට එක එක ඒවා කිය කිය කැකිරි පලන එක සිරිසේන නම් කැමති ඔය කොල්ල මැරෙනවට ඔය හිටියට කෙල්ලට කැමතිත් නෑ. හදාගත්ත ළමයෙක්ලුනේ" එවිටම ඇතින් හඬක් ඇසුණි. "දොස්තර මහත්තයෝ... ගුණපාල මාමෙ..." මොහොතකට පෙර කතා මාතෘකාව වූ දැරිය දැන් ඔවුන් ඉදිරියේ හඬමින් සිටී. "අනේ දොස්තර මහත්තයෝ.... උදව්..."

# සිව්වන පරිච්ඡේදය….

කමලාවතී තවමත් කෙඳිරි ගායි. අමර තම මව දෙස බලා සිටියේය කමලාවතී මෙසේ සතියක පමණ කාලයක් දුක් වින්දාය. ගොඩ බෙහෙත් වලින් පලක් නොතිබුණි. අමරට වැඩි දෙයක් තේරුණේ නැත. නැගණිය දුකින් බලා සිටිනවා තේරුනද කළ හැක්කක් නොතේරේ.

කමලාවති අපහසුවෙන් නැගිට අමරට කතාකර තමා ළඟ ඉන්දවා ගත්තාය. “මයේ පුතේ….මේහෙ වරෙන් උඹ මං කියන ටික හොදට මතක තියාගනින්………… මං මේ ටික ලියුමක ලියලා මේ ලාච්චුවට දලා තියෙනවා අදාල දවසට ඒක ඇරගනින්” මව පුතුට සියල්ල කීවාය. අම්මා කෙනෙකුගේ සෙනෙහස තේරුම් ගැනීමට අමර වාසනාවන්ත නොවීය.නමුත් කියන දේ තේරුම් ගැනීමට හා ලිවීමට ඔහුට තරමක හැකියාවක් ඇත.මේවා ඔහු නංගි පාසල් ගොස් පැමිණ ගෙදර වැඩ විට ඒ අසල සිට ලබාගත් දැනුමයි.මව පුතුගේ කම්මුල අතගෑවාය.මේ ඇයගේ අවසාන කාලය බව ඇය දනී.කමලාවති කදුලු හෙලමින් පුතු දෙස බලා “ මෙහෙම උඹට ඉපදෙන්න වුණාට මට සමා…වෙයන් මං කි..ය..පුවා හොද…ට ම..තක තියා..ගනින්” කමලාවතිගේ අත එහෙමම වැටුණි.

“ අම්මා” අසලියා දිව ආවාය. “ අනේ දොස්තර මහත්තයෝ බලන්නකෝ” දිව ආ වෛද්‍යවරයා ඔහු සමග පැමිණි ගුණපාල දෙස බලා ඔලුව දෙපසට වැනුවේය.ගුණපාල සිරිසේන සොයා දිව්වේ ය.වෛද්‍යවරයා කමලාවති දෙස බැලුවේය. තලලු මුහුණ අඳුරු ය.අඩවන් දෙනෙතේ කදුලු පිරී ඇත.ඔහු කමලාවතිට පොරවා තිබෙ‍ෟ චීත්තයෙන්ම ඇගේ මුහුණ වැසුවේය. දැරිය කෑ ගසා හැඩුවාය. කොලුවාට වූ දෙය නොතේරෙන නමුත් ඔහුට තමා කල යුතු යමක් තිබෙන බව තේරේ.ඔහු තම නැගණිය දෙස බැලුවේය. ඇය හඩමින් කෑ ගසයි. “ අම්මා….නෑ”

# පස්වන පරිච්ඡේදය....

## වසර 13 ට පසු

නිවස සරසා තිබුණි. එහි අමුතුම දීප්තියක් තිබුණි දැන් එය කටුමැටි ගෙයක් නොවේ.නිවසට අමුත්තන් පැමිණ ඇත.වයසක ගැහැණියක් ඔසරියකින් හා ඇට මාලයකින් සැරසී සිටියාය. කාමරයට ගිය ඇය කාමරය තුල හැඩවෙමින් සිටි මනමාලිය දෙස බැලුවාය."මයේ කෙල්ලේ...අසලියා කෝ බලන්න හරි සිරියාවන්තයි" සුදු හැඩ වැටුණු ඔසරිය හැද කොණ්ඩෙට මල් ගසා සිටි අසලියා කණ්ණාඩියෙන් තම හැඩ බැලුවාය. ඇය වාම් උඩරට මනාලියක් විය.

" මනමාලයා මෙයා දැකලා කලන්තේ දායි.....ඒ තරමට ලස්සනයි"වයසක කාන්තාව අසල සිටි අසලියාගේ මිතුරිය කීවා ය.සැබැවින්ම අසලියා ලස්සන මනාලියක් විය. " මයේ කෙල්ල ලස්සනයි"වයසක කාන්තාව කීවාය. " ලීලාවතී අත්තම්මා හිටින්න අද මම මෙතන නෑ" අසලියා මැහැල්ලගේ අල්ලා ගනිමින් කීවාය. හරි හරි දැන් නැගත ළඟ යං ඉක්මනට සුදු මල් පොකුර අතට ගත් අසලියා ලීලාවතී අත්තම්මා හා මිතුරිය ගවේෂා සමඟ කාමරයෙන් පිටතට පැමිණියාය. වෛද්‍ය ශිෂ්‍යාවක ලෙස තම අවසන් විභාගයට පෙනී සිටීමට නියමිත නැගණිය දෙස බලාසිටි අමරගේ දෙනෙතින් කඳුළු වැටුණි මෙසේ අවසාන වතාවට ඔහු හැඩුවේ නැගණියගේ කොටහළු උත්සවය දිනයේදීය. දිග කලිසමකින් හා සුදු කමිසයකින් සැරසී සිටි ඔහු ට නංගි යැයි ඇමතුවාය. අසලියා බිම බලා ගත්තාය. " ලස්සන අසලියා මලක් වගේ ඔහු ගොතගසමින් වචන පටලවා ගත්තේය වසර ගණනාවකට පසු නංගි යන වචනයට අමතරව ව යමක් කී පළමු අවස්ථාව මෙයයි. මනාලියගේ දෑසේ කඳුළු තිබිණි ස නමුත් ඒවා සතුටු කඳුළින් නොවීය. ඇය අහක බලා ගත්තාය. "යමු" කියා ඇඟෙව්වාය. අනිත් දෙදෙන සමග ඉදිරියට ගියාය.

මගුල ජයටම කෙරුණි. නැගණියගේ උපදෙස් පරිදි අමර ගෙය පිටුපස සිට මංගල්‍යයට අවශ්‍ය සියලු දේ සූදානම් කළේය.ඔහු තමාගේ පවුලේ අයෙකු නොවන බව පෙන්වීමට අසලියාට වුවමනා විය.මීට වසර 5 පමණ පෙර ඇගේ පලමු ප්‍රේමය ඇයට අහිමි වූයේ අයියා නිසාය. අයියා එයට දැඩි සේ අකැමතී විය. ඔහු මන්දබුද්ධිකයෙකු නිසා මේ මඟුලටත් බාධා පැමිණේ යැයි ඇයට අනේක වාරයක් සිතුණි.

මේ මංගල්‍යය ලීලාවති අත්තම්මා සොයා බලා කරන ලද කටයුත්තකි.කමලාවති මිය ගොස් අවුරුදු 2 කින් සිරිසේන නිවස හා දරුවන් අතහැර දමා ගියේය. පසුව ටික කලකින් ඔහු මියගිය බවට ආරංචි ලැබිණි. ලීලාවතී ආච්චි අසලියා පාසල් ඇරී නිවසට පැමිණෙන විට නිවසේ සිටියාය. ඇය කවුරුන් හෝ එක්ක ආවාද, ඇය සොයාගෙන ආවද, යැයි සොයා බැලීමට අසලියාට වෙලා නොතිබුණි.

මංගල්‍යය අවසානයේ අසලියා පිටත් තිබෙන නියමිතව තිබිණ.ඊට පෙර ඇයට කතා කිරීමට අමර ඔවුන්ගේ මව මියගිය කාමරයට ගියේය.

සුළු සුළු වෙනස්වීම් සිදු වී තිබුණද ඒ ඇඳ එතනම තිබුණි. ඇඳ මත අසලියා අඩමින් සිටියාය. මේ ඇඳ මත වසර දහයකට පෙර ඇය වඩාත්ම ආදරය කර ගෑහැණිය ඇය හැර ගියාය. "නංගී" අමර කතා කළේය.

" ඇයි ඇයි මං යනවට සතුටුයිද... කොහොමත් මං යන්නේ මං වැඩිපුරම කැමති මං ඇත්තටම ආදරේ කරපු එක්කෙනා එක්ක නෙමෙයිනේ"අමර පුදුම වී බලා සිටියේය. "පොඩි කාලේ ඉඳන් ඔලුව නැති එකාගේ නංගි කියල මං කොච්චර කොන් උනාද" ඇය හඬමින් කියාගෙන ගියාය. "කැම්පස් එකේදී මං ආදරේ කරපු කෙනා නැති උනේ ඔයා නිසා මතකද.... අපි දෙන්නා පාරෙ යනකොට චාමරට හොඳටම ඔයා ගහපු හැටි, අඩුම තරමේ අම්ම මැරෙද්දිවත් ඔය ඇඬුවද? එයාගේ අන්තිම කැමැත්ත මොකක්ද කියලවත් මං දන්නෙ නෑ. අත්තම්මා නැත්නම් මට මොකද වෙන්නේ? ආයෙ මාව හොයාගෙන නාවට කමක් නෑ හිතක් පපුවක් නැති එකා" කඳුළු කම්මුල් දිගේ රූටා ගියේය. තරහින් දුකින් හෙම්බත්වූ අසලියා ගසාගෙන කාමරයෙන් පිටවිය.

රතිඤ්ඤා පිපිරිණි. ප්‍රීති ඝෝෂා මැද අසලියා පිටව ගියාය. නිවසේ සෙනග අඩු විය. අත්තම්මාද කැවුම් බෙදීමට ගියාය. දරුවා කුඩා කල සිට බලාගත් ඇය මෙය ඇගේ යුතුකමක් සේ සැලකුවාය. අමර තවමත් කාමරයේය.ඔහුගේ දෑස් තෙත් වී තිබිණි. මව මියගිය ඇඳ අසල ලාච්චුව ඇරිය ඔහු ලියුම් කවරයක් පිටතට ගෙන මේසය මත තැබුවේය. කොළ කෑල්ල යමක් කුරුටු ගෑවේය. කඳුළු වැටී කොලේ කොනක් ඉරුණි.

# මාස තුනකට පසු....

අසලියා තේ හදමින් සිටියාය. මේ ඇය වෛද්‍යවරියක ලෙස ගතකළ පළමු සතියේ සොඳුරුදායි. ඇය දැන් අලුත් ජීවිතයට හුරු වී සිටියාය. ඇය මෙයට ප්‍රිය කළාය. ලීලාවතී අත්තම්මාද තම අලුත් ගෙදරට පැමිණ ගියා පමණි. ඇය මිතුරියකගේ නිවසක මළ ගෙදරක යන බව කියා හදිසියේම ගිය සතියේ ගියාය. සීනුව නාද විය.

අසළියා දොර දෙසට පිය මැන්නාය. ඇගේ සැමියා මොහොතකට පෙර නිවෙසින් පිට විය. අද ඇයට නිවාඩු දිනයකි. දොර විවර විය. ඒ පියුම් මහතායි "good morning miss ඔයාට ලියුමක්" ඇය ලියුම රැගෙන නිවස තුලට ගියාය. ඇයට ලියුම් එවීමට කවුරකුත් සිටියේ නැත. අත්තම්මාටද දුරකථනයක් තිබුණි. යෙහෙලියන්ටද හොඳම වර්ගයේ දුරකථන තිබෙන නිසා කොහොමත් ඔවුන් ලියුම් එවන්නේ නැත. අනිවාර්යෙන් මෙය අයියාගෙන් විය යුතුය. ඇය අයියා සමග තරහ අමතක කර ඇත. කෙතරම් කරදර වුවද ලබන සතියේ ඔහු බැලීමට යාමට ඇය සිතාගෙන සිටියාය. ඇය ලියුම විවර කළාය. පුදුමයෙනුත් පුදුමයකි. ඒ ලියුම ගුණපාල මාමාගෙන්ය. එය ඉතා කෙටිය. වාක්‍ය දෙකකි.

දුව,

අයියා නැතිවුණා ඉක්මනට එන්න.

පපුව පිච්චී ගියේය.අසලියා එතැනම බිම කඩා වැටුණි.කඳුලු කම්මුල් දිගේ රූටා ආවේය.ඇය ඉකිගසා හඩන්නට විය.මෙය කිසිසේත්ම බලා බලාපොරොත්තු නොවීය කි ගසමින් අසලියා දිව ගොස් නිවසට අගුලු දැමුවාය. තම නවීන මෝටර් රථයට නැඟ්ගාය .කඳුළු නිසා ඇස් රතු වීය. සිතීමට කාලයක් නැත නැවතත් සුපුරුදු රජරටට ගමන් කළාය.

# අවසාන පරිච්ඡේදය ...

මෝටර් රථය නතර විය. සුපුරුදු නිවස පාලුවට ගොස්ය. ඇය අයියා සමග සෙල්ලං කරපු මිදුල ඔංචිලි බැඳපු ගහ දුකින් බලා සිටියි.

" පුතේ මට සමාවයන් නොකීවට උඹ ගිහින් සතියකට විතර කලින් වෙලා තියෙන්නෙත් මං දන්නෙත් හත් දවසේ දාන දවසේ ෆෝන් කැඩී තිබ්බ නිසා දැනගත්තේ ගමට ආවයින් පස්සේ බැඳපු අලුත උබේ හිත කඩන්න බැරි නිසා කවුරුත් නොකීවේ" මොනවා කිව්වත් ආච්චි කරන්න වැඩි කැමැත්තක් අයියට නොදැක්වූ බව අසලියක් දනී සෙමින් ගෙදරට පිය මැන්නාය ක කුඩා කල මතක් විය යුතුයි අයියට අකුරු කියලා දුන් පාළුවට ගොස්ය. අම්මා හා අයියා සමග හුරතල් වූ කුස්සියත් හිස් බවින් පිරී ඇත. ඇයි එකි ගසමින් මගේ කාමරේට ගියා පපුව පහුරු ගාන්නක් මෙන් වේදනාවක් දැනෙයි. තමා අවසානයට අයියට කතා කළේ මෙතනදීය. කතා කිරීමක් නොව දැනීමකි "හිතක් පපුවක් නැති එකා" කියා කෑ ගැසුවේ මෙතැනදීය. ඇය කෑ ගසමින් හැඩුවාය. ඇය මේසය ළඟ පුටුවේ වාඩිවිය මේසය මතුවූ ලින්ක් කවරේ දුටු අසලියා හැඬීම නවත්තා එය ගෙන ලියම පිටතට ගත්තාය එහි මෙසේ අම්මගේ අකුරුවලින් සටහන් විය .

අසලියා දුවට ,

මයේ දුවේ මං දන්නවා මේක කියවද්දි ඔයා ලඟ මන් නෑ, අයියා මේක ගැන දන්නවා එයාට වැඩිය තේරුමක් නෑ. මේ ලියුම ගැන. හැබැයි මේක අදාල දවසට ඔයාට දෙන්න කියලා මං එයාට කිව්වා හැමදේටම වඩා එයා ඔයාට ආදරෙයි ඔයාට තාත්තා කැමති නැති වුණේ ඔයා හදාගත්ත ළමයෙක් නිසා, මහ රෑක ඔයාව ගේ දොර ඉස්සරහ ඉඳලයි හම්බුනේ, හැබැයි මට ඔයාව මගේම දුවෙක්, අයියට එයාගෙම නංගියක්, ඔයාගේ නෑදෑයෝ වගයක් මට හම්බුනා. එයාලා ඔයා පොඩි කාලෙ ඔයාව ඉල්ලුවා මං දුන්නේ නෑ. ඒ ඉල්ලුව කෙනෙක් ලීලාවතී ආච්චි එයාව හොයාගෙන එන්න කියලා මං අයියට කිව්වා.මේක කියවද්දි ඔයා බැඳලා නම්, සතුටින් නම්, මං ඔයාගේ අයියට පින් දෙනවා මගේ අසලියා මල බලා ගත්තට ,

මීට අම්මා

අසලියාට වේදනාව අතිශයින්ම දැනුණි.මුළු පපුවම පිච්චෙනවා වගේ දැනුණේ ඊට යටින් තිබූ ඡායාරූපය දුටු විටය. එහි තරුණයෙක් සහ තරුණියක් අත්වැල් පටලාගෙන සිටියේය. අත්වැල් පටලවාගෙන සිටි තරුණයා ඇයගේ පලමු පෙම්වතා චාමරය.ඒ තරුණිය අසලියා දැක නැත.අසලියා ඡායාරූපය පිටුපස බැලුවාය.එහි කෙටි සටහනක් විය.

" අසලියා,

චාමර හොඳ කෙනෙක් නොවේ.මේ දැන් එයාගේ අලුත් එක්කෙනා. එයා මගේ පස්සෙනුත් ආවා.ඔයාට හොඳ ජීවිතයක් තියෙනවා.එයාට රැවටෙන්න එපා

තරුෂි"

මෙය කියවූ අසලියා නොනවත්වා හැඩුවාය. ඇය චාමර සමග සිටි මුල් කාලයේ මේ ලියුම ලැබී ඇත.අයියා මෙවැන්නක් ගැන කියෙව්වද අසලියාට ඒ ගැන වගක් තිබුණේ නැත. ඇගේ මුලු ලෝකෙම චාමර විය.

කොල කැබැල්ලක් මේසය මත තිබුණි. ඇයට මුළු ලෝකයම නැති වූවා සේ දැනුණි. එහි යමක් කුරුටු ගා ඇත. එය පොඩි කාලේ ඇය ඉගැන්වූ අකුරු වලින් අයියා ලියා තිබුවකි. අසලියා ඉකිගසමින් කොළ කෑල්ල අතේ ගුලි කර ගනිමින් වත්ත පහළට දිව්වාය අම්මාගේ සොහොනට එහායින් ඇගේ වීරියා නිදා සිටි සොහොන ඇත.එය වටේම අසළියා ගස්වල මල් පිපි සුවද හමයි. අයියගේ සොහොන උඩ ඒවා වියනක් මෙන් වැටී ඇත. ඇය හැඩුවාය. කොල කෑල්ල ඉරි තිබුණේ අයියාගේ කඳුළුවලින් විය යුතුය. පොඩි කාලේ ඉඳන් අසලියා මලේ ආරක්ෂාවට සිටි රැකවලා දැන් නොයන ගමනක් ගිහින්. කොළ කැබැල්ලේ මෙසේ විය.

'මට සමාවේන්න මගෙ අසලියා මල'

... නිමි...

# අසලියා ගැන පොඩි සටහනක්...

“අසලියා” කියන්නේ එච්චර ප්‍රසිද්ධ නැති වුණාට ලස්සන මලක්. හැමෝම පොත්වලට දාන්නේ මල්වල නම් උදාහරණ මතක් වෙනවා ඇතිනේ . මටත් ඒ රැල්ලට යන්න ඕන වුණේ නෑ. හැබැයි මලක් කියන්නේ ජීවිතයේ පටන් ගැන්මේදී හම්බෙන මල් පොකුරේ ඉඳන් සුන්දර ආදරේදී දෙන මල් පොකුරු වෙනකමුත් අවසානයේ මිනී පෙට්ටිය ළඟ තියෙන මල්වඩම වෙනකමුත් ජීවිතය එක්කම බැඳිලා තියෙන දෙයක්. ඉතින් මිහිරිම දේවල් වගේම වේදනාකාරීම දේවලුත් මල්වලට ලස්සනට පෙන්නන්න පුලුවන්. ඒ හින්දා මම මේ පොතටත් මලක නමක් දැම්මා.
(මල ගැන දන්නේ නැති අයට මලේ ෆොටෝ ටිකක් පහලින් දැම්මා)



***" මලක සුවඳ වගේ කවදාවත්
නොමියෙන්න ආදරය කරන්න"***

***ඩැෆඩිල්-ඩේසි,***

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)